
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



# සත්‍යයේ මොහොත මෙයයි !

**අ**ද පමණයි ඉතිරිව පවතින්නේ.......
හෙටවන විට අප නැත හමුවන්නේ.......

ඉහත දැක්වෙන්නේ **පරසතුමල්** චිත්‍රපටයේ **අමරදේව** ගායනා කරන **මහගම සේකර** ලියූ ගීතයක කොටසකි. **ඕමාර් ඛයියාම්**ගේ **රූබයියාට්** පද්‍යයක ද අර්ථය එය විය. මෙම දර්ශණය කොහෙන්ද? කුමන මූලාශ්‍රයකින් බිහිවී ද?

ඊයේය කියා දවසක් තිබුණා. එය අද මතකයක් පමණකි. හෙටය කියා දවසක් එන බව අපි දනිමු. එහෙත් එය තවම නො ආ බැවින් එවැනි දවසක් ද නැත. එය ද ඊයේ මෙන් සිතේ පමණක් තිබෙන දවසකි. එසේ නම් සැබැවින්ම පවතින දවස කුමක් ද? ඒ දවස නම් අද ය. මේ අප ජීවත්වන අද දවස ය. මේ තීරය කියවන මොහොතේ ඔබ සිටින්නේ අද දවසේ මුල, මැද හෝ අග විය හැකි ය. එසේ නම් අද දවසේත් ඔබ සිටින්නේ දෙපැත්තේ ඇති ගෙවී ගිය සහ තවම නො ආ කාලයන් අතරය. එය හොඳින් ඔබට වැටහෙනවා නම් සැබැවින්ම ඔබ ජීවත්වන, ඔබට දැනෙන එකම මොහොත මේ පත්‍රය කියවන මොහොතයි. ඒ මොහොත ද තත්පර ගණනට බෙදා ඇත. ඒ ගැන දිගින් දිගටම සිතුවහොත් ජීවිතය යයි අප අවුරුදු ගණනක මහා දෙයක් ලෙස සිතා සිටින දෙය කොතරම් සුළු මිනින්නට ද පවා බැරි අංශු මාත්‍රයක පැවැත්මක් පමණක් බව අප වටහා ගත යුතු ය.

එහෙත් ඒ සුළු කාලය තුළය හැම දෙයක්ම සිදුවන්නේ. හුස්මගැනීම, කනබොන, අඬින පළඬින, රැකියාව කරන, ප්‍රීතිවන, ප්‍රේමකරන, තරහ වෙන, ගහ බැණගන්නා, මේ සියල්ල ඒ ජීවත්වන ක්ෂණයේ ක්‍රියාකාරකම් පමණකි. තත්පරයකිනුත් දශමයකටත් වඩා අඩු ඒ ක්ෂණයන් එකතුකර අපි එයට ජීවිතයයි කියමු.

ජීවිතය මෙසේ සුළු ක්ෂණයන්ගෙන් සැදුම් ලද්දේ වුවද එහි වටිනාකම ඇත්තේ ඒ සුළු මොහොත නිවැරදිව ජීවත්වන්නේ නම් පමණකි. එවැනි ඉතා සුළු ක්ෂණයකින් මානව වර්ගයාට සුවිසල් මෙහෙවරක් කරන්නට හැකි ය. එසේම අහස් යාත්‍රාවක් හප්පා ඇමරිකාවේ දැවැන්ත නිවුන් කුලුණට කළාක් මෙන් විශාල විනාශයක් කරන්නට ද හැකි ය.

බුදු දහම යනු අන්කිසිවක් නොව මේ ක්ෂණයක පැවැත්ම පිළිබඳ සත්‍යයයි. අවුරුදු දෙදහස් පන්සීයකට පෙර සිද්ධාර්ථ ගෞතම යාණන් වහන්සේ ලෝක ධාතුව දිය බුබුලකට සමාන කරමින් මෙම ක්ෂණයක පැවැත්ම පිළිබඳව ද, පැවැත්ම හා නොපැවැත්ම ද දෙකක් නොව එකක් යයි දේශනා කළ කල්හි ද එය බොහෝ දෙනෙකුට තේරුම්ගැන්ම අපහසු විය. තේරුම් ගත්තෝ වහා ඒ අනුව කටයුතු කර සංසාරයෙන් එතෙර වූහ. එහෙත් අද නවීන විද්‍යාව කතා කරන්නේ ද මේ ක්ෂණය ගැනය. විද්‍යුත් ඒකකයන්හි ඇතිවී නැතිවී යන ස්වභාවය ගැනය. විද්‍යාව බෞද්ධ දර්ශණයට පට හැනි නොව ඒ හා සමානව ගමන් කරන බව ද අද ඔව්හු පිළිගනිති.

ඔබ කුමන ආගමක් ඇදහුවද ඉහත සඳහන් කළ සත්‍යයට පිටුපා යා නොහැකිය. නිවන් දකින්නට හෝ ස්වර්ගයට යාමට හෝ මෙලොව දියුණුවට ව්‍යාපාරයක් රැකියාවක් හෝ කළ යුත්තේ මේ මොහොතේම ය. වැටෙන්නට ඔන්න මෙන්න සූදානම්ව තණ කොළයේ අග එල්ලෙමින් තිබෙන පිනිබිඳ ඔබ ද මම ද අපි සියල්ලෝම ද වන්නෙමු. සත්‍යයට පිටුපා නොයා එය තේරුම් ගන්නට මහන්සිගන්න. මේ වෙසක් මස සත්‍යයට ඔබේ දෑස හා මනස විවෘත වේවා!

# Buddha a Great Human Being
# බුද්ධ නම් වූ උතුම් මිනිසා



Those who do not know the Buddha properly, consider Him a God. The Buddha never esteemed such unnecessary glory, praise or honour. Nor did He expect such things.

" O Bhikkhus, gains, offerings, glory, praise are all harsh and fierce. They are a danger preventing the achievement of the highest bliss of liberation. "

The Buddha appeared among men solely to make people see their ignorance, lack of awareness, wrong views, fallacies, and wrong actions. Such a great man will never expect limitless deference, praise or honour from the people.

One day, the Buddha walked along the road from the city of Ukkattha to the city of Setavya. A Brahmin named Drona, travelling along the same road after the Buddha, saw His footprints. He looked at them and thought, " These can never be the footprints of a human being. " The Buddha stepped aside from the road and sat under a tree. Brahmin Drona walked up to the Buddha, whose demeanour was exceedingly calm and serene, and questioned Him thus:

**Brahmin :** Are you a God ?
**The Buddha :** Brahmin, I am not a God.
**Brahmin :** Are you a Gandharva? ( divine musician )
**The Buddha :** Brahmin, I am not a Gandharva.
**Brahmin :** Are you a Yakkha ?
**The Buddha :** Brahmin, I am not a Yakkha.
**Brahm :** Are you a human being ?
**The Buddha :** Brahmin, I am not a human being either.
**Brahmin :** When I ask you whether you are a God, you say “ No, I am not a God. ” When I ask you whether you are a Gandharva, Yakkha or a human being, you say “ No. ” If that were so, then who are you ?
**The Buddha :** O Brahmin, if I am a god, I must have those sense-desires. But, I have eradicated sense-desires fully. Therefore, I am not a God. If I am a Gandharvaa, I must have sense-desires. But I have eradicated those fully. Therefore, I am not a Gandharvaa.O Brahmin, if I am a Yakkha, I must have the sense-desires that a Yakkha should have. But, I eradicated all that fully. Therefore, I am not a Yakkha, either. O Brahamin, if I am an ordinary human being, I must have the sense-desires of ordinary men. But, I have totally eradicated those. Therefore, I am not a human being like other human beings.

♦ **Ven. Weragoda Sarada Maha Thero**
***The Singapore Buddhist Meditation Centre***
**Jalan Mas Puteh, Singapore**

**බු**දුන් වහන්සේ ගැන හරියටම නොදන්නා අය උන්වහන්සේ දෙවි කෙනෙක් ලෙස සිතති සලකති. බුදුන් එලෙස අනවශ්‍ය වර්ණනාවන්ට හා ගරු සැලකිලි ආදියට නොකැමතිවූ අතර එවැනි දේ කිසිවෙකුගෙන් බලාපොරොත්තු වූයේ ද නැත.

“ මහණෙනි, ලාභ සත්කාර, පුදපූජා, කීර්ති ප්‍රශංසා රළු, එමෙන්ම දරුණු දේය. ඒවා ඔබගේ උතුම් වූ විමුක්තිය ලඟාකරගැන්මට බාධා කරන බව දැනගන්න.....” උන්වහන්සේ වදාළහ. ජනතාව අතර උන්වහන්සේ ගැවසුණේ ඔවුන්ට ඔවුන්ගේ වැරදි අදහස් හා වැරදි ක්‍රියා වටහා දී යහපත් මගට ගැන්ම පිණිසය. සත්‍යය පිළිබඳ අන්ධවූ ඔවුන්ගේ දෑස් පාදනු පිණිස ය. ඒ සඳහා ස්තුති ප්‍රශංසා කිසිවක් කිසිවෙකුගෙන් උන්වහන්සේ බලාපොරොත්තු නොවූහ.

දිනක් බුදුන්වහන්සේ දඹදිව සේතව්‍ය නම් නගරයේ මහ වඩිනා විට එම මාර්ගයේම උන්වහන්සේට පසුපසින් ගමන් ගත් ද්‍රෝණ නම් බ්‍රාහ්මණ තරුණයෙක් බුදුන්ගේ අඩිසටහන් දැක මේ නම් මනුෂ්‍යයෙකුගේ වෙන්නට බැරියයි සිතුවේය. ඔහු මෙසේ ප්‍රශ්න කළේ ය.

***ද්‍රෝණ*** : ඔබ දෙවියෙක් ද?
***බුදුන් වහන්සේ*** : නැත! බ්‍රාහ්මණය.
***ද්‍රෝණ*** : ඔබ ගාන්ධර්වයෙක් ද?
***බුදුන් වහන්සේ*** : නැත! බ්‍රාහ්මණය.
***ද්‍රෝණ*** : ඔබ යක්ෂයෙක් ද?
***බුදුන් වහන්සේ*** : එසේත් නැත!
***ද්‍රෝණ*** : එසේ නම් ඔබ මනුෂ්‍යයෙක් ද?
***බුදුන් වහන්සේ*** : නැත! බ්‍රාහ්මණය. මම මනුෂ්‍යයෙකුද නොවෙමි.
***ද්‍රෝණ*** : ස්වාමීනි, ඔබගේ කතාව මට නොවැටහේ. ඔබ දෙවියෙක් දැයි ඇසූ විට නැත කීවෙහිය. දෙව්ලොව වාදක ගාන්ධර්වයෙක් ද නොවේ යයි කීය. යක්ෂයෙකුද නොවේ. මනුෂ්‍යයෙකු ද නොවේ යයි කියයි. එසේ නම් ඔබ සැබැවින්ම කවරහුද?
***බුදුන් වහන්සේ*** : බ්‍රාහ්මණය! දෙවියන්ට ආශාවන් ඇත. මම ආශාවන් සියල්ල නැසූවෙක්මි. එනිසා මා දෙවියෙකු නොවේ. යක්ෂයන්ටද, ගාන්ධර්වයන්ටද ආශාවන් ඇත. එනිසා මා ඔවුන්ගෙන් කෙනෙකුද නොවේ. මනුෂ්‍යයන්ට ආශාවන් ඇත. මා ආශාවන් මුළුමනින් නැසූ බැවින් මම ඒ කියන අන්දමේ මනුෂ්‍යයින්ගෙන් කෙනෙකුද නොවෙමි.

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතෝපදේශයෙන්

**මුඛං පවිත්‍රං යදි බුද්ධ වාක්‍යං**
**චින්තෙපි යස්මිං කරුණා ගුණ: ස්‍යාත්**
**හස්ත්‍රම් පවිත්‍රං ප්‍රදදාති දානං**
**පාදං පවිත්‍රං ගමනං සුභං චෙත්**

***අර්ථය*** : *යමෙක් බුද්ද වචනය කියාද, යමෙක් මෛත්‍රී කරුණාව සිතාද, යමෙක් දන් දේද, යමෙක් වැඩදායක ගමන් යේද මේවායින් ඔවුන්ගේ මුව, හෘදය, හස්ත හා පාද ශුද්ධ වන්නේය.*

යමෙකුගේ මුව, සිත, අත් හා පා පිරිසිදු වන ආකාරය මෙම පද්‍යයෙන් විස්තර කර ඇත. අනෙක් අතට සිත, කය, වචනය යන දොරටු තුන පිරිසිදු කර ගන්නේ කෙසේද යන්න මින් උගන්වයි. විශේෂයෙන් කෙනෙක් හොඳ වැඩ කිරීමට හෝ නරක වැඩ කිරීමට හෝ භාවිතා කරන දොරටු තුන මේ සිත, කය හා වචනයයි. මෙම දොරටු තුනට මෙම පද්‍යයේ සඳහන් කරන සිත, වචනය හා අත්පා ඇතුළත්ය.

මෙහි පළමුව සඳහන්ව ඇත්තේ වචනය පාලනය කරගන්නේ හෙවත් කට රැකගන්නේ කෙසේද යන්නයි. එයට හොඳම මාර්ගය ලෙස සඳහන් කරන්නේ බුදුවදන් ප්‍රකාශ කිරීමයි. බුදු වදන් හෙවත් බුද්ධ ධර්මය යනු සත්‍යය හෙවත් සත්‍යය පදනම් කරගත් ධර්මයයි. එනිසා යමෙකු සත්‍යවාදී වෙත්නම් එම සත්‍යයම ඔහුගේ හෝ ඇයගේ මුව පිරිසිදු වීමේ මාර්ගයයි. එසේම එය යහපත් ජීවන ප්‍රතිපදාවේ මාර්ගයයි. අසත්‍ය වූත්, නපුරුවූත්, රළු පරළු හා හිස් වචන කිසිවෙකුත් ඇසීමට ඇළුම් කරන ඒවා නොවේ. මුදු මොළොක් වචනයම, සත්‍ය වචනයම ප්‍රිය වේ. වදනංවර හෙවත් වදනං පවර යනුවෙන් බුදුන් වහන්සේට නමක් තබා ඇත්තේද උන්වහන්සේ සත්‍යයම පදනම් කොට හැම දේශනාවක්ම කර ඇති නිසයි. උන්වහන්සේගේ දේශනා අර්ථවත්, වගේම අන් අයගේ හිත සුව පිණිස පවතින ඒවාය. අප මේ සසරට දැඩිව බැඳ තබන අනන්ත අප්‍රමාණ පාපයන්ටද මෙම මුවින් පිටවන වචන හේතු පාදක වේ. එක වචනයකට රටක් රැකීමේ බලයක් තිබෙන්නා සේම එක වචනයකට ජාතියක් විනාශ කිරීමේ බලයක්ද ඇත. යනුවෙන් චීන හින් යුන් නම් භික්ෂූන් වහන්සේගේ කියමනද මෙහි සඳහන් කිරීම උචිත යයි සිතමි.

දෙවන කරුණ, සිත පිරිසිදු කරගන්නා හොඳම විධිය නම් මෛත්‍රී හා කරුණා සිතිවිලිත් හද පුරවා ගැනීමයි. කෝපය හා වෛරය මෙම කරුණා මෛත්‍රී සිතිවිලි වල අනෙක් පැත්තයි. යස්ස පාණෙ දයා නත්ථි තං ජඤ්ඤා වසලො ඉති යන වසල සූත්‍ර පාඨයට අනුව යමෙක් අනුන් කෙරෙහි කරුණා දයා ඇතිකර නොගන්නේ නම් එබඳු අය ඉතා පහත් අය හෝ වසලයන් ලෙස සඳහන් කර ඇත. කරුණා මෛත්‍රී සිතුවිලි මනුෂ්‍යත්වය ඉක්මවා ගිය අතිමානුෂීය ගුණයන් ලෙස ධර්මයේ සඳහන්වේ. සංස්කෘත උපදේශ සාහිත්‍යයේ එන කියමනකට අනුව මේ ලෝක අවකාශය තුළ ක්‍රෝධ සිතුවිලිවලින් ගහන වූ දුර්ජනයන් බොහෝ සිටින බැවින් ඔවුන් සියළු දෙනා නැසීම අසීරු කාර්‍යයකි. එබැවින් කළයුතු හොඳම දෙය වන්නේ ඔවුන්ගේ ක්‍රෝධ සිතුවිලි නැසීමයි. එනිසා තමන්ගේ සිත පිරිසිදු කර ගැන්මේ හොඳම ක්‍රමය අන්‍යයන් කෙරෙහි කරුණා, දයාව සහ මෛත්‍රිය වැනි උසස් සිතුවිලි පැතිරවීමයි.

අසරණයින්ට පිහිටවීම, සුබසාධන වැඩ කටයුතු වල නිරතවීම ඊට අයත් දේවල්ය. ධර්මයට අනුව පරිත්‍යාගය තුන් අතකට කළ හැකිය. පළමුවැන්න අන් අයගේ සතුට සහ සුබ විහරණය සඳහා ලෞකික වස්තූන් පරිත්‍යාග කිරීමයි. මෙයට ආහාර, පාන, ඇඳුම් පැළඳුම් පොත් පත්, මිළ මුදල් ඇතුළත්ය. දෙවැන්න අන් අයට කරදරයක් දුකක් ඇතිවූ අවස්ථාවලදී තම කාලය, කරුණාව, දයාව වැනි හැඟීම් වලින් පිහිටවීමයි. තෙවැන්න ධර්ම පරිත්‍යාගය හෙවත් ධර්මානුකූල හොඳ අවවාද අනුශාසනාදියෙන් සංග්‍රහකිරීමයි.

මෙහි අවසන් කරුණ ලෙස සඳහන් වන්නේ දෙපා පිරිසිදු වන ආකාරයයි. ඒ වැඩදායක ගමන් යාමෙනි අනුන්ගේ යහ පත සඳහා හෝ තමන්ගේ යහපත සඳහා යෑමයි. මේ දෙකටම වඩා හොඳ ගමන නම් දෙපාර්ශවයේම යහපත තකා ගමන්කිරීමයි.



♦ **රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති**
***පූජ්‍ය විල්ඹය විමලජෝති හිමි***
***ලන්ඩන් බෞද්ධ විහාරය***

**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**